| සුවෙන් පෙරට<br>e ඉගෙනුම් පියස<br>මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය | ZEOM<br>කලාප අධ්‍යාපන කාර්යාලය - මිනුවන්ගොඩ<br>மண்டல கல்வி அலுவலகம் - மினுவாங்கொட<br>Zonal Education Office - Minuwangoda | |
|---|---|---|
| වාරය - 03 | | |
| ශ්‍රේණිය:11 | විෂයය :තොරතුරු හා සංනිවේදන තාක්ෂණය | පාඩම :බහු මාධ්‍ය තාක්ෂණය යොදා ගනිමින් සරල වෙබ් අඩවි නිර්මාණය |

# 5.පාඩම
# බහු මාධ්‍ය තාක්ෂණය යොදා ගනිමින් සරල වෙබ් අඩවි නිර්මාණය

## වෙබ් අඩවි නිර්මාණය සඳහා තොරතුරු ව්‍යුහගත කිරීම

වෙබ් අඩවියක් නිර්මාණය කිරීමේ අවශ්‍යතා

1. තොරතුරු සංනිවේදනය
2. වෙළෙඳාම
3. විනෝදාස්වාදය
4. ප්‍රචාරණය
5. ප්‍රවෘත්ති බෙදාහැරීම
6. ..................................................
7. ..................................................
8. .................................................

ග්‍රාහක කණ්ඩායම්

වෙබ් අඩවියකට ප්‍රවේශ වී එය පරිශීලනය කරන පුද්ගලයෝ එම වෙබ් අඩවියේ ග්‍රාහකයන් ලෙස හැඳින්වේ.ග්‍රාහක_විවිධත්වය ඇති වීමට බලපාන හේතු කිහිපයකි.

1. භාෂාව හා සාහිත්‍ය
2. වයස් මට්ටම
3. අධ්‍යාපන මට්ටම
4. ..................................
5. ....................................

වෙබ් අඩවියක අන්තර්ගතය

වෙබ් අඩවියක් තුළ ඇති ශ්‍රව්‍ය දෘශ්‍ය තොරතුරු සහ සේවා සියල්ල එහි අන්තර්ගතය ලෙස හැඳින්වේ.එනම්,

| | |
|---|---|
| විවිධ පාඨ | ප්‍රකාශන හිමිකම සහ යාවත්කාලීන බව පිළිබඳ තොරතුරු |
| රූප | අධිසන්ධාන |
| ශබ්ද | දැන්වීම් |
| වීඩියෝ | සෙවුම් පහසුකම |
| සජීවීකරණ | |

සන්ධාරය සංවිධානය

වෙබ් අඩවියක් සඳහා තෝරා ගත් අන්තර්ගතය ,ක්‍රමවත් පිළිවෙළකට පෙළ ගැස්වීම සන්ධාර සංවිධානය ලෙස හැඳින්වේ.මනාව සන්ධාර කළමනාකරණය කිරීම නිසා ලැබෙන වාසි කිහිපයකි.

- පරිශීලනය කිරීම පහසුය.
- ඉතා ඉක්මනින් ග්‍රාහකයාට අවශ්‍ය තොරතුරු සොයා ගත හැක.
- ග්‍රාහකයන් ආකර්ෂණය කර ගනී.
- යාවත්කාලීන කිරීම පහසුය.
- පසු කාලීනව නව අංග එකතු කිරීමේ ඉඩ ප්‍රස්තා සහිතයි.

සංකීරණ වෙබ් අඩවියක් සන්ධාර සංවිධානය කිරීම සඳහා භාවිතා වන ක්‍රම කිහිපයකි.

1. රූපමය සැකසුමට අනුව වර්ගීකරණය
2. මුල් පිටුවෙන් වෙබ් අඩවියේ සමස්ත අන්තර්ගතය කෙටියෙන් නිරූපණය කිරීම.
3. තොරතුරු කෙටියෙන් ඉදිරිපත් කිරීම
4. අංකිත ලැයිස්තු ,අංකිත නොවන ලැයිස්තු, හෝ අනුජේදන භාවිතය
5. පහසුවෙන් වෙබ් අඩවියේ සැරිසැරීමේ හෙවත් සංචලනය වීමේ පහසුකම ලැබීම
6. යාවත්කාලීන බව

වෙබ් පිටුවල ව්‍යුහය හා පිරිසැලසුම

එනම් වෙබ් පිටු සඳහා යොදන පසුතල ,වගු,රාමු,වර්ණ ,අකුරු ආදියයි .ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතු කරුණු කිහිපයකි.

1. සෑම වෙබ් පිටුවක්ම වෙබ් අඩවියේ අනන්‍යතාවය පවත්වා ගැනීම.
2. වැදගත් කරුණු උද්දීපනය
3. ඕනෑම පරිගණකයකින් වෙබ් අඩවිය පරිශීලනය කළ හැකි වීම.

මාධ්‍ය සම්පත් තෝරා ගැනීම

වෙබ් අඩවියකට ඇතුළත් කරන විවිධ පාඨ, රූප,ශබ්ද, වීඩියෝ, සජීවීකරණ ආදිය මාධ්‍ය වේ.මාධ්‍ය සම්පත් ඇතුළත් කිරීමේදී සැලකිලිමත් විය යුත කරුණු කිහිපයකි.

1. ධාරිතාව
2. හිමිකම් නීතියට අනුකූලව මාධ්‍ය සම්පත් ඇතුළත් කළ යුතුය.

## මූලික HTML භාවිතය

හැඳින්වීම

Hyper Text Markup Language (HTML) යනු ලෝක ව්‍යාප්ත ජාලය සඳහා ලේඛන සැකසීමට භාවිතා කෙරෙන මූලික ලියවිල්ලකි.මෙය පරිගණක භාෂාවක් නොව විස්තර කිරීමේ භාෂාවකි.

HTML මගින් වෙබ් පිටු සැකසීම සඳහා Notepad මෘදුකාංගය භාවිතා කළ හැකිය. Notepad යනු වින්ඩෝස් මෙහෙයුම් පද්ධතිය සමග ලැබෙන සරල වදන් සකසන වැඩසටහනකි.

Notepad වැනි වදන් සකසන වැඩසටහන් වෙනුවට HTML සංස්කාරක ලෙස හඳුන්වන පහත මෘදුකාංග භාවිත කල හැක.


- CoffeeCup
- Seamonkey Composer
- Eclipse

HTML ලේඛනයක් save කරන ආකාරය


File ⟶ Save As ලෙස දැක්වීමෙන් පසු ගොනුවේ නම සඳහන් කොට ගොනු දිගුව ලෙස .html ලෙසත් ගොනු වර්ගය all files ලෙසත් දක්වා සුදුසු ෆෝල්ඩරයක තැන්පත් කල යුතුය.

HTML හි ලක්ෂණ

- HTML උසුලන මගින් වෙබ් පිටුව සංදර්ශනය කල යුතු ආකාරය වෙබ් අතිරික්සුවක පෙන්වා දෙයි. HTML ලේඛනයක වූ මෙවැනි විධාන HTML කේත ලෙස හැඳින්වේ.
- HTML උසුලනයක මුලට සහ අගට කෝණික වරහන්(< >) තිබිය යුතුය.
- සාමාන්‍යයෙන් HTML උසුලන යුගල වශයෙන් දක්වනු ලබයි.අවසාන කිරීමේ උසුලනය සඳහා back slash (/) සමග උසුලනයේ නම දැක්විය යුතුය. එමෙන්ම ආරම්භක අවස්ථාවක් පමණක් ඇති උසුලන ද ඇත.
  උදා- <br>, <img>
- සාමාන්‍යයෙන් මෙම උසුලන Case sensitive නොවේ. එනම් ඉංග්‍රීසි භාෂාවේ capital අකුරු හෝ simple අකුරු යොදා ගැනීමෙන් එහි අර්ථයට කිසිදු වෙනසක් නොවේ.
- උසුලන වැරදි ආකාරයට දක්වා ඇතිනම් ඒ සඳහා දෝෂ ප්‍රකාශ (error message) නිකුත් කිරීමක් සිදු නොවන අතර වෙබ් අතිරික්සුව විසින් අදාළ විධානය නොසලකා හැරීම පමණක් සිදුවේ.
- HTML උසුලනයක මූලිකාංගය (Element) ,ගුණාංගය (attribute) හා අගය (value) ලෙස කොටස් 3 ක් ඇත.



## HTML ලේඛනයක මූලික ව්‍යුහය




## Html උසුලන සහ ඒවායේ කාර්යයන්

| උසුලන | කාර්යය |
|---|---|
| <html> | Html file එකක ආරම්භය දක්වීම |
| <head> | වෙබ් පිටුවෙහි ශීර්ෂය ආරම්භ කිරිම |
| <title> | වෙබ් පිටුවෙහි ශීර්ෂයට නාමක් යෙදීම(පිටුව තුළ අන්තර්ගත නොවේ. |
| <body> | Html එකක අන්තර්ගතයේ ආරම්භ දක්විම |
| <h1>to <h6> | මාතෘකා වර්ග 6 ක් නිරූපණය කරයි. |
| <font .........> | අකුරු හැඩසවීමට භාවිත කරයි.(size,color,face ලෙස ගුණාංග 3 ක් ඇත.) |
| | Size - අකුරු ප්‍රමාණය |
| | Color- අකුරු වර්ණය(RGB ලෙස හෝ සම්මත වර්ණ ලෙස) |
| | Face- අකුරු වර්ගය |
| <b> | තද පැහැ ගැන්වීම(bold) |
| <i> | ඇල කිරීම(italic) |
| <u> | යටි ඉරක් යෙදීම(underline) |
| <em> | අවධාරණය කර දැක්වීම(emphasis) |

| | |
|---|---|
| <s> | අකුරු හරහා ඉරක් දැක්වීම(strike out) |
| <sup> | උඩු ලකුණු දැක්වීම (superscript) |
| <sub> | යටි ලකුණු දැක්වීම (subscript) |
| <marquee> | තිරස් දිශාවට චලනයක් සිදු කිරීම |
| <p …..> | ඡේදයක් වෙන් කිරීම(එකෙල්ල කිරීමට align ගුණාංගය භාවිත කරයි) |
| <br> | පේළි වෙන් කිරීම සිදුකරයි |
| <img …..> | පින්තූරයක් ඇතුළත් කිරීම(මෙහි ගුණාංග කිහිපයක් ඇත.) |
| | Src-පින්තූර ගොනු මාර්ගය ගොනු නාමය සහ ගොනු දිගුව |
| | Alt - පින්තූරය දිස් නොවේ නම් පින්තූරය වෙනුවට පෙන්විය යුතු පාඨය මෙහි දැක්වීම |
| | Width -පින්තූරයේ පළල පික්සල් සංඛ්‍යාවක් ලෙස හෝ පිටුවෙන් ප්‍රතිශතයක් ලෙස හෝ දැක්වීම |
| | Height- පින්තූරයේ උස පික්සල් සංඛ්‍යාවක් ලෙස හෝ පිටුවෙන් ප්‍රතිශතයක් ලෙස හෝ දැක්වීම |
| | Border - පින්තූරයේ බෝඩරයේ ඝනකම දැක්වීම |
| | align- පින්තූරය එකෙල්ල කිරීම |
| <hr …..> | තිරස් රේඛා යෙදීම(මෙහි Size,color,width,align ලෙස ගුණාංග ඇත) |
| <ol …> | අංකිත ලැයිස්තු ඇතුලත් කිරීම (type ලෙස ගුණාංගයක් ඇත.) |
| <ul ..> | අංකිත නොවන ලැයිස්තු ඇතුලත් කිරීම(type ලෙස ගුණාංගයක් ඇත) |
| <li> | අයිතම වෙන් වෙන්ව දැක්වීම |
| <dl> | විස්තරාත්මක ලැයිස්තුවක ආරම්භය |
| <dt> | අයිතම හැඳින්වීම |
| <dd> | අයිතමයට අයත් විස්තරය |
| <a ……. | අධිසන්ධාන නිර්මාණය කිරීමට(සම්බන්ධය ඇති කළ යුතු වෙබ් පිටුව ,පාඨය හෝ රූපය ඇති ස්ථානය href ගුණාංගය මගින් පෙන්වයි) |

| | |
|---|---|
| <table> | වගුවේ ආරම්භය |
| <caption> | වගුවට මාතෘකාවක් හෝ විස්තරයක් එහි ඉහලින් ඇතුළත් කිරීමට |
| <th> | වගුවේ තීරුවට මාතෘකාවක් එක් කිරීම |
| <tr> | වගුවට පේළි එකතු කිරීම |
| <td> | වගුවේ පේළියක් තුළ දත්ත ඇතුළත් කිරීම |
| <colspan> | තීරු කිහිපයක් එකතු කර කෝෂයක් සෑදීම |
| <rowspan> | පේළි කිහිපයක් එකතු කර කෝෂයක් සෑදීම |
|   | වාක්‍යයක වචන අතර පරතරය සකස් කර ගැනීම |
| <boby bgcolor> | පසුබිමට වර්ණයක් යෙදීම |
| <boby background> | පසුබිමට රූපයක් යෙදීම |
| <!—comment--> | පිටුවේ නොපෙන්වන දෙයක් දැක්වීමට |

## වෙබ් නිර්මාණ මෘදුකාංග

වෙබ් නිර්මාණ මෘදුකාංග භාවිතයෙන් වෙබ් අඩවි ඉතා ඉක්මණින් අලංකාරව සකසා ගත හැකි අතර චිත්‍රක අතුරු මුහුණතක් තුළ වෙබ් අඩවි නිර්මාණයට ,සංශෝධනයට, පෙර දසුන් දැක්විමට මෙන්ම ඇතැම් විට උඩුගත කිරීමටද පහසුකම් සපයයි.විවිධ වර්ගයේ වෙබ් නිර්මාණ මෘදුකාංග ඇත.

1. වෙබ් සංස්කාරක
2. සන්ධාර කළමණාකරණ පද්ධති(CMS)

<u>වෙබ් සංස්කාරක</u>

නිර්මාණකරු විසින් චිත්‍රක අතුරු මුහුණත භාවිතයෙන් වෙබ් පිටුව නිමවනු ලබන අතරතුර ස්වයංක්‍රීය ලෙස අදාළ html ලේඛනය ද වෙනම ම අතුරු මුහුණද සකස්වේ.
විවෘත කේත වෙබ් සංස්කාරක - Kompozer , Ckeditor, Bluegriffon
මිලදී ගත හැකි වෙබ් සංස්කාරක - Adobe dream weaver, Microsoft front page, Visual studio

ස්ථිතික වෙබ් අඩවි සහ ගතික වෙබ් අඩවි

සන්ධාරයේ ස්වභාවය අනුව වෙබ් අඩවි වර්ග 2 කි.

1. ස්ථිතික වෙබ් අඩවි -
   වෙබ් අඩවියක සන්ධාරය නොවෙනස්ව හෙවත් ස්ථාවර ලෙස යම්කිසි කාලයක් පවත්වාගෙන යන වෙබ් අඩවි වේ.සාමාන්‍යයෙන් HTML භාෂාව මුල් කරගත් වෙබ් අඩවි වේ.ඉතා සරල ලෙස මෙම වර්ගයේ වෙබ් අඩවි සකස් කර ගතහැකි අතර වෙබ් අඩවි පරිශීලනයේදී ග්‍රාහකයන් ,සේවාදායක සමග සෘජුවම සම්බන්ධ නොවේ.
2. ගතික වෙබ් අඩවි -
   වෙබ් අඩවියක සන්ධාරය නිරන්තරව වෙනස් වන වෙබ් අඩවි වේ.මේවා PHP, ASP.net, JSP වැනි පරිගණක භාෂාවලින් සකස් කර ඇත.මෙම වෙබ් අඩවි ග්‍රාහකයින්, සේවාදායක සමග සෘජුවම සම්බන්ධවේ.

   උදා - 1. ..............................................................................................
   2. ..............................................................................................

සන්ධාර කළමණාකරණ පද්ධති(CMS)

ගතික ලෙස වෙබ් අඩවි නිර්මාණයට ,සන්ධාර කළමණාකරණයට හා ප්‍රකාශයට පත් කිරීමට භාවිතා කෙරෙන මෘදුකාංග සන්ධාර කළමණාකරණ පද්ධතිවේ.

විවෘත කේත CMS මෘදුකාංග සඳහා උදාහරණ

1.Joomla

2.....................

3.......................

වෙබ් අඩවි නිර්මාණය ආශ්‍රිත භූමිකා

1. වෙබ් අඩවි නිර්මාපක -වෙබ් අඩවියේ අතුරු මුහුණත සැලසුම් කිරීම
2. සංස්කාරක -කේත ලිවීම, දෝෂ පරීක්ෂාව හා දෝෂ නිවැරදි කිරීම
3. ප්‍රකාශක- වෙබ් අඩවිය ප්‍රකාශයට පත් කිරීම
4. වෙබ් අඩවි පරිපාලක-වෙබ් සේවාදායකයාට සහ දත්ත පාදකවලට අදාළව නඩත්තු කටයුතු සිදු කිරීම
5. පරිශීලකයන් - වෙබ් අඩවිය පරිශීලනය කිරීම

වෙබ් අඩවි ප්‍රකාශයට පත්කිරීම

වෙබ් අඩවියක් නිර්මාණය, වෙබ් සත්කාරයක් වෙතට උඩුගත කිරීම, වරින් වර සිදුකරන යාවත්කාලීන කිරීම් සහ මාර්ගගත පළකිරීම් යන කාර්යයන් සියල්ල මෙයට අයත් වේ.මේ සඳහා වෙබ් අඩවි ප්‍රකාශකයෙකු සපුරා ගත යුතු අවශ්‍යතා කිහිපයකි.

1. වෙබ් අඩවි නිර්මාණ මෘදුකාංගයක්
2. වෙබ් සත්කාරකයක්
3. වසම් නාමයක්
4. උඩුගත කිරීමේ මෘදුකාංගයක්
5. අන්තර්ජාල සම්බන්ධතාවක්

වෙබ් සත්කාරකයක

නිර්මාණය කරන ලද වෙබ් අඩවිය, අන්තර්ජාලය ඔස්සේ ඕනෑම අයකුට ඕනෑම මොහොතක , ඕනෑම තැනක සිට ප්‍රවේශ විය හැකි ලෙස කිසියම් ස්ථානයක තැන්පත් කර තැබීමේ සේවා සපයන පරිගණක වේ.

නොමිලේ වෙබ් සත්කාරක සේවා සපයන ආයතන

1............................................ 2..................................................

වසම් නාමයක්

වසම් නාමයක් තෝරා ගැනීමේදි සැලකිලිමත් විය යුතු කරුණු කිහිපයකි.

1. වසම් නාමය මගින් වෙබ් අඩවිය අයත් ආයතනය පිළිබඳව හෝ වෙබ් අඩවිය සකස් කිරීමේ අරමුණ පිළිබඳව හඳුන්වා දීම සුදුසුය.
2. වෙබ් අඩවියේ ස්භාවය අනුව සුදුසු පරිදි ඉහළ මට්ටමේ වසම් නාම(.com , .edu, .org, .lk ) සම්බන්ධ කළ හැක.
3. පරිශීලකයන්ට මතක තබා ගැනීමට මෙන්ම නිවැරදිව යතුරු ලියනය කිරීමට වසම් නාමය කෙටි විය යුතුය.
4. වාචිකව වෙබ් ලිපිනය කියවීමේදී ,අසන්නා වෙත නිවැරදිව සන්නිවේදනය වීම සඳහා වසම් නාමය තුළ ඉලක්කම්,යා ඉරි වැනි අක්ෂර නොවන වෙනත් අනුලක්ෂණ ඇතුළත් නොවිය යුතුය.

උඩුගත කිරීමේ මෘදුකාංග

නිර්මාණය කරන ලද වෙබ් අඩවිය අදාළ අන්තර්ජාල සම්මුතීන්ට අනුව ,තෝරා ගත් වෙබ් සත්කාරකයා වෙත උඩුගත කිරීමට භාවිත කරන මෘදුකාංග වේ.

උදා- Filezilla , SmartFTP

අන්තර්ජාල සම්බන්ධතාව

අන්තර්ජාල සේවා සපයන ආයතන කිහිපයකි.


1. ශ්‍රී ලංකා ටෙලිකොම්
2. ලංකා බෙල්
3. ..............................
4. ................................

වෙබ් අඩවි නඩත්තුව

වෙබ් අඩවියක සාර්ථකත්වය සඳහා අංශ කිහිපයක් යටතේ නඩත්තු කිරිම සිදු කරයි.

1. වෙබ් අඩවියේ ස්භාවය මත දෛනික ව, සතිපතා හෝ මාසික ව එහි අන්තර්ගතය යාවත්කාලීන කිරිම.
2. වෛරස වැනි අහිතකර කේත ,අනවසර ඇතුලු වීම් ආදිය නිසා වෙබ් අඩවියේ දෝෂ ඇතිවීම නිසා යාවත්කාලීන කිරිම.
3. වෙබ් අඩවිය නිර්මාණයට යොදා ගත් මෘදුකාංගවල නව අනුවාද නිකුත් වීම නිසා යාවත්කාලීන කිරිම.

## වෙබ් අඩවි නිර්මාණය කිරිම සහ සංවර්ධනය කිරීමේ ක්‍රියාවලිය




ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

- ♣ නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 1. | HTML ලේඛනයක තිරස් රේඛාව ඇඳීම සඳහා අදාළ උසුලනය වනුයේ, | | | | | | | |
| | (1) | <br> | (2) | <hr> | (3) | <tr> | (4) | <a href> |
| | | | | | | | | |
| 2. | HTML භාවිතයෙන් වෙබ් අඩවියක් නිර්මාණයේදී <caption>උසුලනය මගින් සිදු කරගත හැකි කාර්යය කුමක්ද? | | | | | | | |
| | (1) | වෙබ් පිටුවට මාතෘකාවක් යෙදීම | | | | | | |
| | (2) | රූපයට මාතෘකාවක් යෙදීම | | | | | | |
| | (3) | වගුවට මාතෘකාවක් හෝ විස්තරයක් ඇතුළත් කිරීම | | | | | | |
| | (4) | චලන රූප ඇතුළත් කිරීම | | | | | | |
| | | | | | | | | |
| 3. | පහත සඳහන් ඒවායින් blank tag යුගලය වන්නේ, | | | | | | | |
| | (1) | <img> <br/> | (2) | <tr> <th> | (3) | <img> <b> | (4) | <em> <i> |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 4. | පහත සඳහන් ඒවායින් විවෘත කේත වෙබ් සංස්කාරකයක් නොවන්නේ, | | | | | | | |
| | (1) | Kompozer | (2) | Visual studio | (3) | CKeditor | (4) | Bluegriffon |

5. සුදුසු පද යොදා හිස්තැන් පුරවන්න.

I. වෙබ් අඩවියක සන්ධාරය නිරන්තරව වෙනස් වන්නේ නම් එය .................................. ලෙස හඳුන්වයි.

II. වෙබ් අඩවියේ අතුරු මුහුණත් සැලසුම් කිරීම සිදු කරනුයේ ................විසිනි.

III. .......................... යනු වෙබ් අඩවියක් උඩුගත කිරීමේ මෘදුකාංගයකි.

IV. වෙබ් අඩවියකට ප්‍රවේශ වී එය පරිශීලනය කරන පුද්ගලයෝ එම වෙබ් අඩවියේ .............................. වේ.

V. ................... වෙබ් අඩවි නිර්මාණය කිරීම සහ සංවර්ධනය කිරීමේ පියවරකි.

(උඩුගත කිරීම, Joomla, ගතික, ග්‍රාහකයා, ස්ථිතික, ප්‍රකාශක , ,Filezilla, වෙබ් අඩවි නිර්මාපක )

6. රූපය 1 හි දක්වා ඇති වෙබ් පිටුවෙහි HTML ප්‍රභවය 1 - 10 දක්වා ලේබල් කර ඇති උසුලන හො පරාමිති නොමැතිව රූපය 2 මගින් දක්වා ඇත.




රූපය 1

```
<html>
<boby>
<1>WELCOME TO SRI LANKA</1><br>
<img 2 ="srilanka.jpg"width="150"
height="75"><3>
Sri Lanka is a beautiful country.<br>
It is in the <4>Indian Ocean.</4><br>
There are many places.
<5 border="1">
<tr>
<6>Places</6><th>Famous for</th>
</tr><tr>
<td>Yala</td><td 7="2">National Park</td>
</tr><tr>
<8>Wilpaththu</8>
</tr>
</5>
<a 9="www.nationalpark.lk">
<10>www.nationalpark.lk</10></a>
</body>
</html>
```

රූපය 2

රූපය 1 හි 1 - 10 දක්වා ලේබල් කර ඇති ස්ථාන සඳහා ගැගපෙන නිවැරදි උසුලනය පහත දී ඇති ලැයිස්තුවෙන් තෝරාගන්න. එක් එක් ලේබල අංක සහ අදාළ නිවැරදි HTML උසුලනය ලියා දක්වන්න.

(td, b , table, i , u,  href, p,src , th, colspan, rowspan , br)

7. රූපය 2 හි පෙන්වා ඇති මූල කේතය භාවිත කර නිර්මාණය කෙරෙන රූපය 1 හි දී ඇති නිදර්ශක වෙබ් පිටුව සලකන්න.




රූපය 1

```
<html>
<head>
<title>Coronavirous</title>
</head>
<1>
<h1><2>COVID - 19</2> </h1>
<3 src ="coronavirous.jpg"width="200"
height="100">
<4 size="5" ><p align="left">
Most common sympoms</p></4>
<5 type= "dis">
<li>fever</li>
<li>Dry Cough</li>
<li>Tireness</li>
<li>loss of taste or smell</li>
</5>
<font 6="5" ><p align="left">
Coronavirous prevention.</p></font>
<7 type= "1">
<li>Use mask</li>
<li>Distance</li>
<li>Wash Hand</li>
<li>disinfection</li>
<li>Quarantine</li>
</7>
<8 href="www.health.gov.lk">
www.health.gov.lk</8>
</1>
</html>
```

රූපය 2

රූපය 2 හි දැක්වෙන කේතයෙහි 1 සිට 8 දක්වා ලේබල් කර ඇති තැන් සඳහා HTML උසුලන හෝ පද අටක් අඩුව ඇත. නිවැරදි උසුලනය/පද පහත දී ඇති ලැයිස්තුවෙන් තෝරා ලියන්න.

(h1,a, img, caption, body, u, ol, font, ul, size)

සැකසුම - එල්.ඒ.අයි.ඉරෝෂනි ලියනගේ මිය

මිනු/කිතුල්වල මුනිදාස කුමාරතුංග ක.වි